**ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී අපහරණය කරන ලද රු.2,687,265 ක මූල්‍ය නොවන වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණවලින් ඉවත් කර නොතිබුණි | මෙම වර්ෂය තුළදී එම අයිතම සිගාස් පද්ධතියට යාවත්කාලීන කිරීමට කටයුතු කොට ඇත. | වර්ෂය තුළදී අපහරණ කරන ලද වත්කම්වල පිරිවැය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 50 (II) අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරියා වගබලා ගත යුතු වුවත් පහත පරිදි ඉතිරි කිරීම් සිදුකර තිබුණි. | | |
| (අ) ප්‍රාග්ධන වැය විෂයයන් 02කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු750,000ක් හා කල්බදු ක්‍රමයට වාරික ගෙවීම සඳහා වෙන්කළ රු.600,000ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ 01/2016 ප්‍රකාර මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ දෙපාර්තමේන්තුව වෙත ලබාගත් වෑන් රථයේ කල්බදු ගිවිසුම දීර්ඝ කර තබා ගැනීමේ අරමුණින් මෙම වැය විෂයට ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබූ | ඇස්තමේන්තුව අනුව නිවැරදිව සැලසුම් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අතර ජාතික අයවැය චක්‍රලේඛ 01/2022 අනුව එම ගිවිසුම අවසාන කිරීමට සිදුවීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වූ බව සඳහන් කරමි. | |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 09කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය රු.52,215,000ක් හා වියදම රු.38,413,869ක් වූයෙන් එක් එක් වැය විෂයන්හි සියයට 18ක සිට සියයට 59 ක් දක්වා අතර පරාසයක වන පරිදි රු.13,801,131ක ඉතිරිවීම් පැවැතුණි. | විමසුමේ සඳහන් පරිදි 2023.12.31 දිනට ඇතැම් පුනරාවර්තන වැය විෂයන්ගේ ඉතිරිවීම් පෙන්නුම් කලද 2023 වසරට අදාලව තවදුරටත් ගෙවීම් කළයුතු බැරකම් පවති. | බැරකම් අඩු කළ ද ඉතිරිවීම් පවතින බැවින් ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය. |
| (ඇ) ප්‍රාග්ධන වැය විෂයයන් 02කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය රු.750,000ක් හා වියදම රු.344,460ක් වූයෙන් එම වැය විෂයන්හි පිළිවෙලින් සියයට 13 ක් හා සියයට 74ක් වශයෙන් එකතුව රු.405,540ක ඉතිරිවීම් පැවැතුණි. | අපේක්ෂිත පරිදි යන්ත්‍රෝපකරණ, පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම් සිදු නොවීම මෙම ඉතිරියට හේතුව වන බව සඳහන් කරමි. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොරටුව විශ්ව විද්‍යාලය විසින් සකස් කරන ලද පිරිවැය රු.10,810,000ක් වූ සිංහල, දෙමළ මෘදුකාංගයේ නිරවද්‍යතාවය පිළිබඳ සහතිකයක් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් 2022 පෙබරවාරි 14 දින ව්‍යාපෘති අධ්‍යක්‍ෂවරයාගෙන් ඉල්ලා තිබුණද, එය ලබාදී නොතිබුණ අතර වර්තමානය වන විට එම මෘදුකාංගය වෙනුවෙන් දැරූ පිරිවැය නිශ්කාර්යව පවතී. | මෙය භාවිතය පිළිබඳ දෙපාර්තමේන්තු පරිවර්තකයන් හා ඒකාබද්ධ සේවයේ පරිවර්තකයන් 61 ක් සඳහා 2023.1.12 දින පුහුණුවක් සහ 2023.02.14 වන දින Admin & Manager privileges ලෙස දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ නිලධාරී හා තවත් නිලධාරියෙකු වෙත ලබාදීම සඳහා අවශ්‍ය වන පුහුණුවක් දැනටමත් ලබා දී ඇත. මේ වන විට භාෂා පරිවර්තන මෘදුකාංගය භාවිතා කිරීමට පරිශීලකයින් 189 ක් හා ආයතන 19 කට ඉඩ ලබාදී ඇත. එමෙන්ම ඉදිරියේදී රජයේ විවිධ ආයතනවල නිලධාරීන් සඳහා මෙම මෘදුකාංගය භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් වැඩිදුරටත් සඳහන් කරමි. | මෘදුකාංගයේ අඩුපාඩු හඳුනාගෙන පරිවර්තන කටයුතු සඳහා සක්‍රීය දායකත්වයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය සේවකයන් හා අර්ධ රාජ්‍ය සේවකයන් විසින් සම්පූර්ණ කළ යුතු වාචික, ලිඛිත හා කථන භාෂා ප්‍රවීණතා පාඨමාලා සඳහා 2016 සහ 2018 වර්ෂවල මිලදීගෙන තිබූ රු.5,347,048ක වටිනා පොත් තොගයක් හා 2018 වර්ෂයේ මුද්‍රණය කර තිබූ “ලියන සිංහල” පොත් 54 ක් අලෙවියට නුසුදුසු තත්ත්වයෙන් ද, අලෙවි නොවන හා භාවිතයට ගත නොහැකි පරිසර විද්‍යා පොත් 477ක් හා සත්ව විද්‍යා පොත් 71ක් ද ගබඩාවේ පැවතුනි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPA/ADM/EST/GA19/Dep.Lan. හා 2021.12.28 දිනැති ලිපිය අනුව මෙම පොත් රජයේ ආයතන/ පාසල් පුස්තකාලවලට නොමිලයේ නිකුත් කිරීමට අනුමැතිය හිමිවී ඇති බව දන්වන අතර මේවන විට ලැබෙන ඉල්ලීම් අනුව පොත් නිකුත් කිරීම් කටයුතු සිදු කරන බව හා මතුපිට කවර දුර්වර්ණ වී තිබෙන ග්‍රන්ථ 54 හී කවර නැවත සකසා අලෙවියට කටයුතු කරන බව. | අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රමාණවත් පොත් පමණක් මුද්‍රණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 17 වන දින රු.314,450ක් වැය කර මිලදී ගනු ලැබූ පොත් අලෙවි කළමනාකරණ මෘදුකාංගය අක්‍රියව පැවතුණි. තවද, කොරෝනා වෛරසයෙන් ආරක්ෂා වීමට අදිනු ලබන රු.130,000 ක් වටිනා ඉවත දැමිය හැකි ඇඳුම් කට්ටල 400 ක් නිකුත් කිරීමකින් තොරව ගබඩාවෙහි පැවතිණි. | මෙම පද්ධතිය මේ වනවිට අක්‍රිය වී පවතින අතර මේ සම්බන්ධ අදාල ආයතනය වසා දමා ඇති බැවින් පද්ධතිය නැවත යථා තත්වයට පත් කිරීමේ කටයුතු සිදුකළ නොහැකි තත්ත්වයක පවතී. කෙසේ වුවද, වසර 04 කට ආසන්න කාලයක් පද්ධතිය මඟින් අපේක්ෂිත කටයුතු ඉටුකර ගෙන ඇති අතර, ඉදිරියේදී වෙනත් ආයතනයක් හරහා පද්ධතිය නැවත සැකසීම හෝ නව පද්ධතියක් මිලදී ගැනීමට කටයුතු යොදන බව හා ආරක්ෂිත ඇඳුම් කට්ටල 400 අවශ්‍යතාවය සළකා බලා රෝහලකට නිකුත් කිරීමට කටයුතු කරන බව. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් කිරීමට හා මිලදී ගැනීම් තීරණ සම්බන්ධයෙන් අදාල නිලධාරීන් වගකීමට යටත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 06ක්, තෘතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු 34ක්, ද්විතියික මට්ටමේ | රාජ්‍ය භාෂා කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ.) තනතුර හා කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු මේ වන විට සම්පූර්ණ කර ඇත. නියෝජ්‍ය | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීම හෝ අනුමත අත්‍යවශ්‍ය නොවන කාර්ය මණ්ඩලය |

| | | |
|---|---|---|
| තනතුරු පුරප්පාඩු 13ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 05ක් වශයෙන් පුරප්පාඩු 58ක් පැවැතුණ අතර පුරප්පාඩු පිරවීම හෝ තනතුරු සංශෝධනය කිරීම සිදුකර නොතිබුණි. | කොමසාරිස් (ශ්‍රී ලං. ප. සේ.) තනතුරු 02 සහ නියෝජ්‍ය සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුර සහ භාෂා පරිවර්තක (ඒකාබද්ධ සේවය) තනතුරු 05ක් සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති අතර දෙපාර්තමේන්තුගත කොමසාරිස්/ සහකාර කොමසාරිස්, දෙපාර්තමේන්තුගත තනතුරු වන භාෂා අධිකාරී තනතුරු 08කට සහ භාෂා අධිකාරී (පරිවර්තන) තනතුරු 03ක් බඳවා ගැනීම් පටිපාටි අනුමැතිය සඳහා යොමුකර ඇත.<br><br>පුස්තකාලාධිපති තනතුරු 03ක්, කළමනාකරණ සහකාර තනතුරු 09ක් සහ තොරතුරු තාක්ෂණ සහායක තනතුරු 01ක්, තාක්ෂණ සහායක (දෙපාර්තමේන්තු) තනතුර සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කරමින් පවතී.<br><br>රියදුරු තනතුරු 02 සඳහා බඳවා ගැනීමේ කටයුතු අවසන් අදියරේ පවතින අතර භාෂා පරිවර්තක (දෙපාර්තමේන්තු) තනතුරු 17 සඳහා බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇත. | සංශෝධනය කිරීම කළ යුතුය |